**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 22 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 23 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 ගණුදෙනු මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------------------------------

1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2015 අගෝස්තු 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විගණන විමසුම් වලට අදාලව ගණනය කළහැකි ගණුදෙනුවල වටිනාකම රු. 496,663,011 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම

---------------------------------------------

(i) ගෙවීම් වවුචර් 33 ක් මගින් ගෙවීම් කරන ලද රු. 1,901,958 කට අදාල අවශ්‍ය තොරතුරු ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් නොකිරිම නිසා එකී වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

(ii) සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත අරමුදල් යටතේ රු. 247,000 ක් වැයකර විවිධ පුද්ගලයින් හා සුභ සාධක සමිති සඳහා භාණ්ඩ ලබාදී තිබුණද, එම භාණ්ඩ ලැබුණු බව හෝ අදාල පුද්ගලයින් ඒවා භාරගත් බව සනාථ කරගත හැකි කිසිදු ලේඛනයක් හෝ ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සභාපතිවරයා විසින් භාවිතා කරනු ලබන කැබ් රථය අළුත්වැඩියා කටයුතු සඳහා භාරදීම නිසා සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය පාවිච්චි කිරීම වෙනුවෙන් ඉන්ධන සඳහා රු. 94,720 ක මුදලක් ගෙවා ඇතත්, අදාල ධාවන සටහන් හා ඉන්ධන බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 ආදායම් පරිපාලනය

------------------------

2.1.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

----------------------------------------------------------------

සභා ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 17,432 | 11,634 | 5,798 |
| (ii) බදු කුලී | 8,958 | 7,314 | 1,644 |
| (iii) බලපත්‍ර ගාස්තු | 834 | 198 | 635 |
| (iv) සේවා සඳහා ගාස්තු | 1,926 | 1,012 | 913 |
| (v) වෙනත් ආදායම් | 601 | 207 | 394 |

2.1.2 උසාවි දඩ

----------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් මගින් 2014 දෙසැම්බර් 31 දිනට අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 3,581,469 ක මුදලක් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතුව තිබුණි.

2.1.3 මුද්දර ගාස්තු

---------------

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ටාර් ජනරාල්වරයා විසින් රැස්කරන ලද රු. 775,500 ක මුද්දර ගාස්තු ආදායම් ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතුව තිබුණු අතර 2014 වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් කිසිවක් ලබාගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

2.1.4 හිඟ ජල ගාස්තු

----------------

ජල යෝජනා ක්‍රම 04 කින් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තු ආදායම රු. 5,097,588 ක් වු අතර 2013 වර්ෂය අවසානයේ හිඟ ශේෂය රු. 5,802,441 ක් වීමෙන් හිඟ ජල ගාස්තු අයකර ගැනීමේ ප්‍රගතිය සාමාලෝචිත වර්ෂයේ 1.2% ක් වැනි ඉතා සුළු අගයකින් පමණක් වැඩිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) සභාවේ ආදායම් පරිපාලක තමන්කඩුව ප්‍රාදේශීය සභාව වෙත ස්ථානමාරු කර ඇතත් එම නිලධාරියා භාරයේ තිබුණු ක්ෂේත්‍ර බිල්පොත් 16 ක් විගණන දිනය වූ 2015 අගෝස්තු 31 දින වනවිට ද ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 කට අදාලව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදල් 50% සිට 100% දක්වා ඉතිරිවීමක් හා වැය විෂයයන් 6 කට අදාලව ප්‍රතිපාදන මුදල් 100% සිට 430% ක ඉක්මවීමක් සිදුව තිබීමෙන්, ඇස්තමේන්තු සැකසීමේ දුර්වලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් ශේෂය රු. 712,883 ක් වූ නමුත් 2015 ජනවාරි 01 දින එම මුදලින් රු. 550,264 ක් ගිණුම්ගත කර තිබුණු නමුත් ඉතිරි මුදල වූ රු. 162,619 ක් එදිනම ගිණුම් ගත නොකර කඩින් කඩ අවස්ථා ගණනාවකදී ගිණුම්ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ කාලය මාස 06 ඉක්මවූ රු. 767,394 ක් වටිනා චෙක්පත් 35 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ 2 ඉක්මවූ රු. 276,810 ක් වූ තැන්පතු ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 පෙබරවාරි 20 සිට 2015 අගෝස්තු 03 දක්වා කාලය තුළ CFL බල්බ 818 ක් මිලදී ගෙන 712 ක් නිකුත් කර තිබුණ ද නිකුත් කිරීම් විස්තර කිසිවක් ලේඛනගත කර නොතිබුණි. ලේඛණ අනුව විගණන දිනය වූ 2015 අගෝස්තු මස 30 වන විට CFL බල්බ 106 ක ශේෂයක් ලේඛනගතව තිබුණු නමුත් භෞතිකව එවැනි ශේෂයක් දක්නට නොලැබුණි

(උ) දිවි නැගුම සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 නොවැම්බර් 17 දින මහජන උපයෝගීතාවයන් සඳහා ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණු රු. 398,520 ක් වටිනා ගැල්වනයිස් කොඩි කණු 360 ක් 2014 දෙසැම්බර් 16 දින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා සභාපතිවරයා විසින් රැගෙන ගොස් තිබුණු නමුත් විගණන දිනය වූ 2015 අගෝස්තු 30 දින වන විටත්, එම ගැල්වනයිස් බට ආපසු ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------

සහල් පිටි නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් දිඹුලාගල ප්‍රාදේශීය සභාව වෙත 2004 වර්ෂයේදී ලබාදී තිබුණු රු. 541,000 ක් වටිනා සහල් පිටි නිෂ්පාදන උපකරණ කට්ටලය මාසික කුලී පදනම මත මහවැලි අධිකාරියෙන් ලබාගත් කඩ කාමර 2 ක ගබඩා කර තිබුණි. එම ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශයේ තෙකලා විදුලිය නොමැතිවීම නිසා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. මෙම උපකරණ කට්ටලය සමාලෝචිත වසර වන විට වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතින.

.

3.3 අවිධිමත් ගණුදෙනු

---------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් සහ 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රතිපාදන සලසා නොමැතිව 2014 ජනවාරි 01 දිනැති අංක එන්සීපී/එල්ජී/ඒ/8/2IV වෙළුම දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිපිය පදනම් කරගෙන සභාපතිවරයාට හා මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන, දුරකථන හා ලිපිද්‍රව්‍ය දීමනා වශයෙන් රු. 537,500 ක් සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) විවිධ සංග්‍රහ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 45,211 ක් වැයකර තිබුණු නමුත් ඒ සඳහා නිසි අනුමැතිය ලබාගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) සහ (ඕ) වගන්තිය ප්‍රකාරව විවිධ පරිත්‍යාග හා විවිධ උත්සව සඳහා වියදම් දැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය රහිතව, සමාලෝචිත වසර රු. 122,941 ක් වැයකර තිබුණි.

(ඈ) 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ රීති 1(I) ප්‍රකාරව සභාපතිවරයෙකු සඳහා සභාවේ රාජකාරි ගමන් සඳහා මසකට දැරිය යුතු ඉන්ධන සීමාව ඩීසල් ලිටර් 400 නොවැඩි විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදී එම සීමාව ඉක්මවා භාවිතා කරන ලද ඉන්ධන ලීටර් 738 ක් වෙනුවෙන් රු. 89,338 ක් සභා අරමුදලෙන් වැයකර තිබුණි.

(ඉ) 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ රීති 1(iiI) ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවට වාහනයක් නොමැති අවස්ථාවක, ඉන්ධන සීමාව තුළ රැඳෙමින් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අවසරය ලබාගෙන, පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලෙන් ඩීසල් ලීටර් 400 ක සමාන මුදලක් වියදම් ලෙස දැරිය හැකි වුවද, එම සීමාව ඉක්මවා රු. 193,500 ක් පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලෙන් ගෙවීම් කර තිබුණි.

(ඊ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහයේ රිති 154 ප්‍රකාරව, රජයේ සේවයෙන් විශ්‍රාමලත් තැනැත්තෙක් නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන නමුත්, සභා තීරණයකට අනුව 2013 ඔක්තෝබර් 03 දින සිට එක්

වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරී තනතුර සඳහා විශ්‍රාමලත් තාක්ෂණ නිලධාරී (සිවිල්) ii 'අ' ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කර, සමාලෝචිත වසර තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු. 213,000 ක් සභා අරමුදලෙන් ගෙවීම් කර තිබුණි.

(උ) ප්‍රාදේශීය සභාවේ කැබ් රථයක් (සංචිත වාහනය) සඳහා 2014 අයවැය මගින් මසකට ඉන්ධන සීමාව ලීටර් 250 ක් ලෙස දක්වා ඇතත්, එයට පටහැනිව එම සීමාව ඉක්මවා රු. 105,801 ක් වටිනා ඉන්ධන ලීටර් 880 ක් භාවිතා කර තිබුණි.

(ඌ) 2013 මග නැගුම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ පරිපාලන වියදම් සඳහා ලබාදෙන මුදලින් කර්මාන්ත රාජකාරි ඉටුකිරිම වෙනුවෙන් කාර්මික නිලධාරි හා අනෙකුත් නිලධාරින් 03 දෙනෙකු සඳහා කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් නොමැතිව රු. 63,957 ක මුදලක් දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.

(එ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 3.1 උප වගන්තියේ දැක්වෙන විධිවිධාන වලට පටහැනිව වැලිකන්ද ප්‍රාදේශීය සභාවට යාම ඒම වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා වශයෙන් රු .39.200 ක් සමාලෝචිත වර්ෂයේදී සභාවේ ලේකම්වරයාට ගෙවා තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා දැනට අනුයුක්ත සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - | - |
| තෘතීයික මට්ටම | 01 | - | 01 | - |
| ද්විතීයික මට්ටම | 14 | 06 | 08 | - |
| ප්‍රාථමික මට්ටම | 32 | 31 | 01 | - |
| අනියම්,ආදේශක,තාවකාලික, කොන්ත්‍රාත් හා මාසික දීමනා පදනම | - | - | - | 41 |
| | 48 | 38 | 10 | 41 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා සංවර්ධන නිලධාරින් 05 දෙනෙකුද, තාක්ෂණ නිලධාරි හා පුස්තකාලාධිපතිවරයෙකුද අනුමත කර තිබුණද, එම තනතුරු වල පුරප්පාඩු පැවතින.

(ආ) සභා අරමුදලින් වැටුප් ලබන අනියම්/තාවකාලික, කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 41 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවී අතිරික්තව සිටින බවට තහවුරු විය.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

1989 අප්‍රේල් 15 දිනැති අංක 584/5 දරන ප්‍රාදේශීය සභා රීති සංග්‍රහයේ 11 පරිච්ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අයවැය සම්බන්ධව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුනි.

4.2 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනිම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය තුලදී පළත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව හෝ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් හෝ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

05. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය